Level 06

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2021/2022

නීති විද්‍යාව - LLU6813

කාලය - පැය එකයි. (01)

---

දිනය - 2022.09.14 වේලාව - ප.ව.01.30 - ප.ව.02.30

---

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 20 ක් හිමිවේ.

1 වන හෝ 2 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත සිදුවීම කියවන්න.

සුතෝපියා යනු සංවර්ධනය වෙමින් පවතින රටකි. සුතෝපියාවේ සංඛ්‍යා ලේඛන කාර්යාංශයට අනුව 2021 දෙසැම්බර් වන විට රටේ ජනගහනය මිලියන විස්සකි. සුතෝපියා හි ජනගහනයෙන් සියයට 30 ක් පමණ වයස අවුරුදු 65 හෝ ඊට වඩා වැඩි වන අතර මෙය ලෝකයේ "වයස්ගතම" රටක් ලෙස ද සැලකේ. සුතෝපියාව ලොව අඩුම සාඵල්‍යතා අනුපාතය (Fertility rate) සහිත රටවල් අතර පවතින රටකි. වැඩිවන වයස්ගත ජනගහනයත් සමග ජනගහන වර්ධනය අඩුවීම සුතෝපියාව තුල අර්බුදයක් නිර්මාණය කර ඇත. මීට මාස කිහිපයකට පෙර, සුතෝපියා පාර්ලිමේන්තුව විසින් " සුතෝපියා දෙවඟන"නමින්, රටේ උපත් අනුපාතය වර්ධනය කිරීම සඳහා නව ප්‍රතිපත්තියක් සම්මත කලේය. මෙම ප්‍රතිපත්තිය මගින් දරුවන් තිදෙනෙකු සිටින කාන්තාවක් සුතෝපියාවේ දෙවඟන ලෙස ගෞරවයට පාත්‍ර වේ. මෙම ප්‍රතිපත්තිය මගින් උපතේ සිට වයස අවුරුදු හතර දක්වා සෑම ළදරුවෙකුටම මූල්‍ය ආධාර සපයන "ළදරු ප්‍රසාද අරමුදල" පිහිටුවා ඇත.

මෑතක දී වයස අවුරුදු 65 සහ ඊට වැඩි ජනගහනය වැඩිවීමට ප්‍රතිචාරයක් ලෙස "වැඩිහිටි ආරක්ෂණ පනත" නමින් පනතක් සුතෝපියානු පාර්ලිමේන්තුව විසින් යෝජනා කරන ලදී. මෙම පනත මගින් "පුළුල් දිගු කාලීන රැකවරණ රක්ෂණයක් " හඳුන්වා දුන් අතර මෙය කලාපයේ වඩාත්ම ත්‍යාගශීලී සහ විස්තීර්ණ සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයක් ලෙස ද සැලකේ. මෙම රක්ෂණය මගින් වැඩිහිටියන්ට සහාය සත්කාරක පහසුකම්, නිවාස රැකවරණය, භාණ්ඩ මිලදී ගැනීමේ සහාය ලබාදීම් ආදී විවිධ සත්කාරක පහසුකම් ඇතුළත් රජයේ අනුමත සත්කාරක සැලසුම් සඳහා ගෙවීම් කිරීමට අදහස් කරයි. ජනගහනයේ වෙනස්වීම ආමන්ත්‍රණය කිරීම සඳහා රජය ක්‍රියාත්මක කල මෙම වැඩිහිටි ආරක්ෂණ පනත සහ පුළුල් දිගුකාලීන රැකවරණ රක්ෂණය, සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස සුතෝපියාව මත ඇති කරන මූල්‍යමය බර පිළිබඳව දක්වන ආර්ථික විශේෂඥයින්ගේ දැඩි විවේචනයට ලක් කර ඇත. මෙම ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සුතෝපියාවේ වත්මන් වැඩකරන ජනගහනය මත අහිතකර බලපෑමක් ඇති කළ හැකි බවද ඔවුහු පෙන්වා දුන් හ.

මෙම විවේචනයන්ට ප්‍රතිචාරයක් වශයෙන් සූතෝපියා රජය ප්‍රකාශ කලේ ඔවුන්ගේ මෙම ප්‍රයත්නයන් සමාන ජනගහන වෙනස්වීමකට මුහුණ දී සිටින සංවර්ධනය වෙමින් පවතින රටක් වන සූසූස් රාජ්‍යයේ ප්‍රතිපත්තීන්ට සමාන බවයි. ජනගහනයේ වෙනස්වීම ආමන්ත්‍රණය කිරීම සඳහා පෙර පැවති රජයන් ද මේ හා සමාන ප්‍රතිපත්ති එනම් ගර්භණී මව්වරුන්ට ගර්භණී සමයේදී මූල්‍ය ආධාර ලබාදීම, වැඩිහිටියන්ට නොමිලේ පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රාජ්‍ය බැංකුවල ඉහළ ඉතුරුම් පොළී අනුපාත ලබාදීම වැනි ප්‍රතිපත්ති අනුගමනය කර ඇති බව සූතෝපියා රජය සඳහන් කළේය. කෙසේ වෙතත් ඇතැම් සමාජ ක්‍රියාකාරී කණ්ඩායම් මෙම යෝජිත ප්‍රතිපත්තිවලට සහය දක්වන අතර සූතෝපියාවේ දරුවන් අපේක්ෂිත දෙමාපියන් තම පවුලට නව ජීවයක් එක්වීම පිළිගැනීම සඳහා "පිළිගැනීමේ කුසුම්" නමින් පරිචයක් අනුගමනය කරන බව ද අවධාරණය කරන ලදී. සූතෝපියාවේ පුද්ගල නීති මගින් වයස්ගත දෙමව්පියන් වෙත සැපයූ අනිවාර්ය ආරක්ෂණය කෙරෙහි ද ඔවුහු අවධානය යොමු කළහ.

ඔබ සූතෝපියාවේ නීති පර්යේෂකයකු යැයි උපකල්පනය කරන්න. තම රටෙහි ජනගහන වෙනස්වීම් ආමන්ත්‍රණය කිරීම සඳහා සූතෝපියා රජය ගත් උත්සාහයන් නීති විද්‍යාවේ පහත දැක්වෙන ගුරුකුල වලින් එකකට **(01)** අදාළ මූලික මතවාදයන් හා සංකල්ප ඇසුරින් විශ්ලේෂණය කරන්න.

01. සමාජ විද්‍යා ගුරුකුලය

02. ඓතිහාසික ගුරුකුලය

**හිමිකම් ඇවිරිණි.**